**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 දෙසැම්බර් 31 මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන 2021 අංක 05**

## ආයතනික යහපාලනය

මුදල් සමාගමේ ආයතනික යහපාලන පරිචයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ආයතනික යහපාලන පිළිබඳ විධාන නිකුත් කරනු ලබන අතර, මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමක් සඳහා ම අදාළ වේ.

**1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම්**

1.1 උපායමාර්ගික දිශානතිය සකස් කිරීම, යහපාලන රාමුවක් ගොඩනැගීම, ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ නියාමන අවශ්‍යතා සමග අනුකූල වීම තහවුරු කිරීම ඇතුළුව මුදල් සමාගමේ මෙහෙයුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්ත වගකීම සහ වගවීම පැවරේ. තම වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පහත සඳහන් 1.2 සිට 1.7 විධාන වල දක්වා සඳහන් කර ඇති කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක කළ යුතු අතර, නමුත් ඔවුන්ගේ කාර්යභාරය එයට පමණක් සීමා නොවිය යුතුය.

1.2 **ව්‍යාපාර උපායමාර්ගය සහ යහපාලන රාමුව**

අ) එළඹෙන වසර තුන සඳහා ළඟා කරගත හැකි ඉලක්ක සමඟ මුදල් සමාගමේ සමස්ත ව්‍යාපාර උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ව්‍යාපාර පරිසරයේ වෙනස්කම් හා අනුරූපීව එය වාර්ෂිකව යාවත්කාලීන කිරීම.

ආ) මුදල් සමාගමේ විශාලත්වය, සංකීර්ණත්වය, ව්‍යාපාර උපායමාර්ගය සහ නියාමන අවශ්‍යතාවලට අනුරූපව මුදල් සමාගමේ යහපාලන රාමුව අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ඇ) යහපාලන රාමුවේ ඵලදායීතාව කාලනුරූපීව තක්සේරු කිරීම.

ඈ) සභාපතිවරයෙකු සහ ප්‍රධාන විධායක නිළධාරියෙකු පත් කිරීම සහ ඔවුන්ගේ භූමිකාව සහ වගකීම් නිර්වචනය කිරීම.

1.3 **ආයතනික සංස්කෘතිය සහ වටිනාකම්**

අ) සදාචාරාත්මක, විචක්ෂණශීලී සහ වෘත්තිමය හැසිරීම් රටාවන් තවදුරටත් ශක්තිමත් කරමින් මුදල් සමාගම තුළ වඩාත් හොඳ ආයතනික සංස්කෘතියක් පවත්වාගෙන යෑම තහවුරු කිරීම.

ආ) චර්යාධර්ම සංග්‍රහයක් ගොඩනැගීම සහ බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය ඇතුළුව මුදල් සමාගමේ ආයතනික සංස්කෘතිය සහ වටිනාකම් ස්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම.

ඇ) මුදල් සමාගමේ ව්‍යාපාර උපායමාර්ගයෙහි සඳහන් සුදුසු පාරිසරික, සාමාජීය සහ යහපාලන සාධක හරහා තිරසාර මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම.

ඈ) මහජනතාව සහ නියාමන ආයතන අභිමුව මුදල් සමාගමේ ක්‍රියාකාරීත්වය, ස්ථාවරය සහ අභිලාෂ පිළිබඳ සමබර දැක්මක් සම්ප්‍රේක්ෂණය කිරීම සඳහා තැන්පතුකරුවන්, කොටස්හිමියන්, ණය ගැතියන් සහ වෙනත් ණය හිමියන් ඇතුළුව සියලුම ඇල්මැති පාර්ශවකරුවන් සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කිරීම.

1.4 **අවදානම් දැරීමට ඇති සූදානම, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය**

අ) මුදල් සමාගමේ ව්‍යාපාර උපායමාර්ගය සහ යහපාලන රාමුවට සමගාමීව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය සමාලෝචනය කිරීම.

ආ) අවදානම් හඳුනා ගැනීම, මග හරවා ගැනීම සහ විචක්ෂණශීලී ලෙස කළමනාකරණය සඳහා සුදුසු පද්ධතීන් සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

ඇ) මුදල් සමාගම්හි අභ්‍යන්තර පාලන පද්ධති සහ තොරතුරු කළමනාකරණ පද්ධති ප්‍රමාණාත්මකව සහ කාර්යක්ෂමව යොදා ගැනීම සහ කාලනුරූපීව සමාලෝචනය කිරීම.

ඈ) මුදල් සමාගමට ස්ථාවරත්වය, මූල්‍ය ශක්තිය සහ අනපේක්ෂිත තත්ත්වයන් යටතේ තීරණාත්මක මෙහෙයුම් හා සේවාවන් ආරක්ෂා කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතාවය සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.

**1.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීම සහ නිපුණතාවය**

අ) මුදල් සමාගමේ වැඩ කටයුතු හා සම්බන්ධ කරුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් ප්‍රමාණවත් කාල සීමාවක් වෙන් කළ යුතුය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අවශ්‍ය සුදුසුකම්, ප්‍රමාණවත් නිපුණතා, දැනුම සහ අත්දැකීම් වලින් පරිපූර්ණ විය යුතුය.

ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලු සාමාජිකයින්ගේ පුහුණුවීම් සහ සංවර්ධන අවශ්‍යතා නිතිපතා සමාලෝචනය කර එකඟ විය යුතුය.

ඈ) සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් සහ එහි කමිටු සම්බන්ධයෙන් එක් එක් අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව පුද්ගල කාර්යසාධනය සිදු කරන ස්වයං තක්සේරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු අතර එහි වාර්තා පවත්වා ගත යුතුය.

ඉ) මුදල් සමාගම් සඳහා වගකීම් සපුරාලීමට ස්වාධීන බාහිර වෘත්තිමය උපදේශනය ලබා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය.

**1.6 ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය අධීක්ෂණය කිරීම.**

අ) ප්‍රතිපත්ති සෘජු කටයුතු, ව්‍යාපාර කටයුතු සහ අවදානම් කළමනාකරණ කටයුතු පාලනය කිරීමට සැලකිය යුතු බලපෑමක් සිදු කළ හැකි තනතුරු දරන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හඳුනා ගැනීම සහ නම් කිරීම.

ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා අදාළ බලතල සහ ප්‍රධාන වගකීම් නිශ්චය කිරීම.

ඇ) මුදල් සමාගමේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, නිපුණතාවයන්, අත්දැකීම් සහ දැනුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සතු වේ දැයි තහවුරු කිරීම.

ඈ) මුදල් සමාගමේ කටයුතු නිසි පරිදි සිදු කර ගෙන යනවා දැයි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අධීක්ෂණය කිරීම තහවුරු කිරීම.

ඉ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් මුදල් සමාගම සතු වේ දැයි තහවුරු කිරීම.

ඊ) ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා ගමන් කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීවය සමඟ නිරතුරුව රැස්වීම් පැවැත්වීම.

**1.7 පවතින නෛතික රාමුවට අනුගත වීම**

අ) තැන්පතුකරුවන්ගේ, කොටස් හිමියන්ගේ සහ අනෙකුත් ඇල්මැති පාර්ශවයන්ගේ අභිලාශ සහ වගකීම් වෙත අනර්ථයක් නොවන සේ මුදල් සමාගම ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

ආ) නියාමන වටපිටාවට අනුගත වීම සහ අදාළ නීති. නියාමන, විධාන සහ ආචාර ධර්ම හා අනුගත වීම.

ඇ) නිසි සැලකිල්ලෙන්, විචක්ෂණශීලීව සහ අඛණ්ඩතාවයකින් යුතුව කටයුතු කිරීම සහ වගකීම් නිසි අයුරින් ඉටු නොකිරීම හේතුවෙන් පැන නගින විභව සිවිල් සහ අපරාධ වගකීම් පිළිබඳව අවධානයෙන් සිටීම.

**2. යහපාලන රාමුව**

2.1 අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව සහ වගකීම්;

ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරුණු කරුණු;

ඇ) අධිකාරීත්වය පැවරීම;

ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය;

ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය;

ඊ) අධ්‍යක්ෂවරුන් නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පත් කිරීම;

උ) අභිමතාර්ථ සට්ටනය වන අවස්ථාවන්හී දී කළමනාකරණය කිරීම;

ඌ) තොරතුරු සඳහා ප්‍රවේශය සහ ස්වාධීන උපදෙස් ලබා ගැනීම;

එ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ ධාරිතා ගොඩනැගීම;

ඒ) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම;

ඓ) සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාව සහ වගකීම;

ඔ) සමාගමේ ලේකම්වරයාගේ භූමිකාව

ඕ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටු සහ ඒවායේ භූමිකාව; සහ

ඖ) සම්බන්ධිත පාර්ශව හා සිදු කරන ගනුදෙනු සඳහා වන සීමා

ආදී විධාන ඇතුළත්ව, නමුත් එපමණකට සීමා නොවී, මෙම විධානවලට සමගාමීව යහපාලන රාමුවක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.

**3. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

3.1 මුදල් සමාගමේ අවශ්‍යතා, එනම්, විශාලත්වය, සංකීර්ණත්වය සහ අවදානම හා අනුරූපීව සහ සුදුසු යැයි සැලකෙන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, නිපුණතා සහ අත්දැකීම් සමබර ලෙස පවත්වාගෙන යෑම තහවුරු කළ යුතුය.

3.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා නොඅඩු විය යුතු අතර, දහතුනකට වඩා නොවැඩි විය යුතුය.

3.3 ප්‍රධාන විධායක නිලධාරී/විධායක අධ්‍යක්ෂ යන තනතුරු දරන අධ්‍යක්ෂවරයෙකු හැරුණු විට, අධ්‍යක්ෂවරයෙකුගේ සමස්ත සේවා කාලය 3.4 විධානයට යටත්ව වසර නමය ඉක්ම නොවිය යුතුය.

3.4 4.2 සහ 4.3 විධානයන් හි සඳහන් ප්‍රතිපාදන වලට යටත්ව සෘජුව හෝ වක්‍රව සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හෝ සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හිමි කොටස්හිමියකු නියෝජනය කිරීම සඳහා පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු, ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර නමය ඉක්මවා ධූරයේ රැඳී සිටීමට හැකියාව ඇත. කෙසේ වුව

ද, වසර නමය ඉක්මවා ධූරයේ රැඳී සිටිය හැකි විධායක නොවන අධ්‍යක්ෂවරුන්, සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් හතරෙන් එකකට (¼) කට සීමා විය යුතුය.

**3.5 විධායක අධ්‍යක්ෂවරු**

අ) මුදල් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සඳහා හැකියාව ඇත්තේ මුදල් සමාගමක සේවකයෙකු පමණක් වන අතර, එහිදී, විධායක අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක ($^{1}/_{3}$) ප්‍රමාණය නොඉක්ම විය යුතුය. විධායක අධ්‍යක්ෂවරුන් අතරින් එක් අයෙකු ප්‍රධාන විධායක නිළධාරියා ලෙස කටයුතු කළ යුතු අතර, සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස නම් කළ හැක.

ආ) මුදල් සමාගමේ ඍජුව හෝ වක්‍රව සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමියෙකු විධායක අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා පත් නොකළ යුතුය. කෙසේ වුවද, සේවා ගිවිසුමක් සහ ක්‍රියාකාරී වාර්තාකරණ ධූරාවලියක් සහිත දැනට කටයුතු කරන විධායක අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මුදල් සමාගමේ විශ්‍රාම යා යුතු වයස් සීමාව දක්වා, විධායක අධ්‍යක්ෂවරයෙකු/ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකු ලෙස කටයුතු කිරීමට අවසර ඇති අතර, 4.2 සහ 4.3 විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කළ හැකිය. මෙම විධානය බලාත්මක වන දිනයේ සිට සේවා ගිවිසුමක් හෝ ක්‍රියාකාරී වාර්තාකරණ ධූරාවලියක් නොමැති විධායක අධ්‍යක්ෂවරුන් විසින් විධායක අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් විය යුතු අතර, විධාන අංක 4.2 සහ 4.3 විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් විය හැකිය.

ඇ) විධායක අධ්‍යක්ෂවරුන් සිටින අවස්ථාවක දී ප්‍රධාන විධායක නිලධාරී විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වන අතර මුදල් සමාගමේ කළමනාකර අධ්‍යක්ෂ ලෙස නම් කළ හැකිය.

ඈ) මුදල් සමාගමේ සංවිධානාත්මක ව්‍යුහයේ සියලුම විධායක අධ්‍යක්ෂවරුන් සඳහා විධිමත් ධූරාවලියක් තිබිය යුතුය.

ඉ) විධායක අධ්‍යක්ෂවරුන් ප්‍රධාන ප්‍රධාන විධායක නිලධාරී හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

ඊ) විධායක අධ්‍යක්ෂකවරුන් වෙනත් ඕනෑම ආයතනයක විධායක අධ්‍යක්ෂ ධූරයක් හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරක් දැරීමෙන් වැළකිය යුතුය.

**3.6 විධායක නොවන අධ්‍යක්ෂකවරු**

අ) උපායමාර්ගික, කාර්යසාධන, සම්පත් සහ ව්‍යාපාර පවත්වාගෙන යෑමේ ප්‍රමිති සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ස්වාධීන විනිශ්චයන් ලබා දීම සඳහා අවශ්‍ය වන සුදුසුකම්, කුසලතා සහ අත්දැකීම් මෙන්ම විශ්වසනීය පුද්ගල කාර්යසාධන වාර්තා විධායක නොවන අධ්‍යක්ෂකවරු සතු විය යුතුය.

ආ) විධායක නොවන අධ්‍යක්ෂකවරයකු මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිළධාරීවරයා/විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතුය.

**3.7 ස්වාධීන අධ්‍යක්ෂවරු**

අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරු සංඛ්‍යාව අවම වශයෙන් තුනක් හෝ සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් ($^1/_3$) අතුරින් ඉහළ අගය ගන්නා සංඛ්‍යාව විය යුතුය.

ආ) පත් කරන ලද ස්වාධීන අධ්‍යක්ෂවරු වෘත්තීය සුදුසුකම්, සනාථ කළ වාර්තා සහ ප්‍රමාණවත් සුදුසුකම් සහිතව ඉහළ මට්ටමේ දක්ෂතා දැක්වූ අයෙකු විය යුතුය.

ඇ)
i. මුදල් සමාගමේ සියයට 5 ඉක්මවා සෘජු හෝ වක්‍ර ඡන්ද අයිතිය හෝ වෙනත් මුදල් සමාගමක සියයට 10 ඉක්මවා ඡන්ද අයිතිය පැවතීම.
ii. මෙහි විධාන අංක 12.1 (ඇ) විධානයෙහි සඳහන් කර ඇති පරිදි, මූල්‍ය තත්ත්වය පිළිබඳව ආසන්නතම විගණන ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි නොපියවා ඇති සමස්ත අගය මුදල් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 10ක් කිසියම් අවස්ථාවක ඉක්මවා ඇති සැලකිය යුතු ව්‍යාපාර සම්බන්ධතාවක් අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී අධ්‍යක්ෂවරයා හෝ සමීපතම ඥාතියෙකු මුදල් සමාගමක් සමඟ පවත්වාගෙන ඇති අවස්ථාවක දී,
iii. අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, මුදල් සමාගම හෝ එහි අනුබද්ධිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළේ නම් හෝ එහි ඕනෑම අනුබද්ධිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර හෝ කරමින් සිටියේ නම්,
iv. අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, මුදල් සමාගම හෝ එහි අනුබද්ධිත ආයතනයකට උපදේශන ලබා දෙන ආයතනයක උපදේශකයෙක් හෝ ප්‍රධාන උපදේශකයෙක්/අනුශාසක ලෙස කටයුතු කිරීම,
v. අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස කටයුතු කළ හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස කටයුතු කරමින් සිටින හෝ මුදල් සමාගමේ ඡන්ද බලයෙන් සියයට 10 ඉක්මවා යන සේ කොටස් සඳහා හිමිකම් කීම හෝ වෙනත් මුදල් සමාගමක ඡන්ද බලයෙන් සියයට 20 ඉක්මවා යන හිමිකාරීත්වයකින් යුතු ඥාතියෙකු සිටී නම්,
vi. මුදල් සමාගමේ කොටස් හිමිකරුවෙකු, ණය ගැතියෙකු, ණය හිමියෙකු හෝ එවැනි සමාන ඇල්මැති පාර්ශවයක් අධ්‍යක්ෂවරයා නියෝජනය කරන්නේ නම්,
vii. මුදල් සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්, සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන මුදල් සමාගමක, අධ්‍යක්ෂවරයා සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි නම් හෝ සෘජු හෝ වක්‍ර සියයට 10ට හෝ ඊට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමිකාරීත්වයක් පවතී නම්,

viii. 12.1 (ඇ) විධානයෙහි අර්ථකථනය කර ඇති පරිදි මුදල් සමාගම සමඟ ගනුදෙනුවක් ඇති අධ්‍යක්ෂවරයා, සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ ඍජු හෝ වක්‍ර ඡන්ද අයිතිය හිමි කොටස් ප්‍රමාණය සියයට 10 හෝ ඊට වැඩි වේ නම් හෝ අංක 12.1 (ඇ) විධානයෙහි අර්ථකථනය කර ඇති පරිදි, මූල්‍ය තත්ත්වය පිළිබඳව ආසන්නතම විගණන ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි නොපියවා ඇති සමස්තය මුදල් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 10ක් කිසියම් අවස්ථාවක ඉක්මවා ඇති මුදල් සමාගමක් සමඟ ගනුදෙනුවක් හිමි මුදල් සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරයෙකු වේ නම්,

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන යැයි නොසැලකේ.

ඈ) අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීනත්වය, හෝ ස්වාධීනත්වය පිළිබඳ දැක්ම සඳහා බලපෑමක් ඇති කළ හැකි, 3.7 විධානයෙහි සඳහන් නොවන කිසියම් සිදුවීමක් හෝ සම්බන්ධතාවයක් වේ දැයි නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය.

ඉ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමේ දී, එම තත්ත්වයට බලපෑම් කළ හැකි අවස්ථාවන්ගේ කිසියම් වෙනසක් වේ නම්, ස්වාධීන අධ්‍යක්ෂවරයා විසින් එය කඩිනමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කළ යුතුය. එවැනි අවස්ථාවක දී, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ තනතුර නැවත සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතු අතර, අධ්‍යක්ෂවරයාගේ තනතුර තහවුරු කිරීමට හෝ වෙනස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ලිඛිතව දැන්විය යුතුය.

**3.8 විකල්ප අධ්‍යක්ෂවරුන්**

අ) i. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය හෝ එහි සංශෝධන යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සමඟ; සහ

ii. දීර්ඝ කාලීන අසනීප තත්ත්වයක් හේතුවෙන් අධ්‍යක්ෂ ධූරයේ වගකීම් නිසි ආකාරයෙන් සම්පූර්ණ කිරීමට වත්මන් අධ්‍යක්ෂවරයාට නොහැකි නම් හෝ විදේශගත වීම හේතුවෙන් අඛණ්ඩව රැස්වීම් තුනකට වඩා පැමිණීමට නොහැකි නම්;

පමණක් විකල්ප අධ්‍යක්ෂවරයෙකු තුළින් නියෝජනය කිරීමට අවස්ථාව සැලසේ.

ආ) ධූරය හොබවන අධ්‍යක්ෂවරයෙකු වෙනත් ධූරය හොබවන අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක.

ඇ) එක් අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලද තැනැත්තෙකු, එම මණ්ඩලයේ ම වෙනත් අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස වැඩ බැලීමෙන් තනතුර දීර්ඝ කර ගත නොහැක.

ඇ) විධායක අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කළ නොහැක.

ඉ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කළ අවස්ථාවක දී, පත් කරන ලද තැනැත්තා විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු සඳහා අදාළ වන නිර්ණායක සම්පූර්ණ කළ යුතුය.

**3.9 විරාම කාලය**

අ) වෙනත් මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස පෙර සේවයේ නියුතු තැනැත්තෙකු මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට පෙර මාස හයක විරාම කාලයක් තිබිය යුතුය. මෙකී තත්ත්වයට වඩා වෙනස් ව්‍යතිරේක අවස්ථාවක දී, එනම් අධ්‍යක්ෂ මණ්ඩලය නැවත ගොඩනැගීම සඳහා එවැනි තැනැත්තන්ගේ විශේෂඥ දැනුම අවශ්‍ය වූ විට, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඒ සඳහා අවශ්‍ය වේ.

ආ) මෙම විධානයේ ප්‍රතිපාදන යටතේ අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස මින් පෙර සලකා ඇත්නම්, එවැනි අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වීමට සුදුසුකම් සපුරා ඇති අවස්ථාවක දී, පත් කිරීම සඳහා සලකා බැලිය යුත්තේ වසරක විරාම කාලයකට පසුව වේ.

**3.10 පොදු අධ්‍යක්ෂ තනතුරු**

කිසියම් මුදල් සමාගමක, මව් සමාගම, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ 3.5 විධානයෙහි නියම කර ඇති කොන්දේසි ප්‍රකාරව ප්‍රථමයෙන් සඳහන් කරන ලද මුදල් සමාගම සමඟ බද්ධ එකඟ වීමක් ඇති අවස්ථාවක හැරුණු විට, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, වෙනත් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම නොකළ යුතුය.

**3.11** අධ්‍යක්ෂවරුන් විසින් හෙබවිය හැකි අධ්‍යක්ෂ ධූර සඳහා යෝග්‍ය සීමාවන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය. කෙසේ වුවද, මුදල් සමාගමක අධ්‍යකෂවරයෙකු විසින් මුදල් සමාගමේ පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඇතුළුව, සමාගම්/සමිති/ආයතන ගණන විස්ස ඉක්මවා යමින් අධ්‍යක්ෂ ධූරයක් හෝ ඒ හා සමාන වෙනත් තනතුරක් (විකල්ප අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතුය) දැරීම නොකළ යුතුය.

**4. යෝග්‍යතාවය තක්සේරු කිරීමේ නිර්ණායක**

**4.1** මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය හා එහි සංශෝධන වලට අනුකූලව, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස ධූරය දැරීම සඳහා කිසියම් තැනැත්තෙකු නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සඳහා හෝ එවැනි මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීම සඳහා, එම තැනැත්තා තනතුර දැරීම සඳහා සුදුසු සහ යෝග්‍ය විය යුතුය.

**4.2** වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයෙකුට මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ නොහැක.

**4.3** ඉහත 4.2 හි සඳහන් ප්‍රතිපාදන නොසලකා හරිමින්, මෙම විධානය නිකුත් කළ දින වන විට තනතුර දරන, 2025.03.31 දින වන විට හෝ ඊට පෙර වයස 70 සම්පූර්ණ කරන්නා වූ අධ්‍යක්ෂවරයෙකු, පහත සඳහන් නිර්ණායකයන්ට යටත්ව අවුරුදු 70 ඉක්මවා උපරිම අවුරුදු 75 දක්වා අධ්‍යක්ෂවරයෙකු ලෙස තනතුරෙහි තවදුරටත් සේවය කිරීමට අවසර හිමි වේ.

(අ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයේ නිශ්චය කරන ලද නිර්ණායක මත පදනම්ව යෝග්‍යතාවය පිළිබඳව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ තක්සේරුව.

(ආ) 4.3 (අ) හි දක්වා ඇති බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ තක්සේරුව මත පදනම්ව මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය.

(ඇ) වයස 70 ඉක්මවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සමස්ත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් $^1/_5$ කට සීමා වීම.

(ඈ) අනුමත දිනය වන විට, අදාළ අධ්‍යක්ෂවරයා විසින් ධූරයෙහි අවම වශයෙන් වසර 03 කට වඩා සම්පූර්ණ කර තිබීම.

**5. අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පත් කිරීම සහ ඉල්ලා අස්වීම**

**5.1** මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයේ ප්‍රතිපාදනවලට අනුකූලව, පත් කිරීම, ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම සිදු කළ යුතුය.

**6. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා**

**6.1** සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර පැහැදිලිව වගකීම් බෙදා දීමක් සිදු විය යුතු අතර, මෙකී තැනැත්තන්ගේ වගකීම් ලිඛිතව සඳහන් කළ යුතුය.

**6.2** පහත සඳහන් 6.3 වගන්තියට යටත්ව සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.

**6.3** සභාපතිවරයා ස්වාධීන නොවන අවස්ථාවක දී, වඩාත් ස්වාධීන තත්ත්වයක් ඇති කරලීම සඳහා සුදුසු ලේඛනගත යොමු නියමයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා පත් කර යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා විසින් අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් අතර අතරමැදියා ලෙස කටයුතු කරනු ඇත. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් සභාපතිවරයාගේ කාර්යසාධනය අවම වශයෙන් වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

**6.4 සභාපතිවරයාගේ වගකීම්**

සභාපතිවරයාගේ වගකීම් යටතට පහත සඳහන් කරුණු අවම වශයෙන් ඇතුළත් විය යුතුය.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දීම.

(ආ) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර බල තුලනයක් පවත්වාගෙන යෑම සහ තහවුරු කිරීම.

(ඇ) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් යන දෙපාර්ශවයේ ම ඵලදායී සහභාගීත්වය තහවුරු කිරීම.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කිරීම සහ වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීම තහවුරු කිරීම.

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලු ප්‍රධාන ගැටලු කාලෝචිත ලෙස සාකච්ඡා කිරීම තහවුරු කිරීම.

(ඊ) නියාමනකරු විසින් ලබා දෙන තීරණ/ විධාන ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමෙන් කටයුතු කිරීම.

(උ) සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ම න්‍යාය පත්‍රය සකස් කිරීමට වගකීමෙන් කටයුතු කිරීම සහ න්‍යාය පත්‍රය සකස් කිරීමේ කටයුත්ත සහ රැස්වීම් වාර්තාව පවත්වාගෙන යෑම සඳහා සමාගම් ලේකම් වෙත පැවරීම.

(ඌ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සෘජු අධීක්ෂණය අවශ්‍ය වන කටයුතු හා දෛනික මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ නොවීම.

(එ) කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යෑම සහ කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම තහවුරු කිරීම.

(ඒ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ පසුගිය මාස 12 ඇතුළත කාර්යසාධනය සහ දායකත්වය පිළිබඳව වාර්ෂික තක්සේරුව සිදු කිරීම.

**6.5 ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම්**

මුදල් සමාගමේ මෙහෙයුම් සහ ව්‍යාපාර දෛනික කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ඉහළම විධායක නිලධාරියා ලෙස ප්‍රධාන විධායක නිලධාරියා කටයුතු කළ යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම්වලට අවම වශයෙන්;

(අ) මුදල් සමාගමේ උපායමාර්ගික පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා ව්‍යාපාර සහ ආපදා කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

(ආ) මුදල් සමාගමේ මෙහෙයුම් ක්‍රියාත්මක වන අතරතුර වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ පාලන කටයුතුවල ඵලදායීත්වය සහ ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම.

(ඇ) ආචාර්යමත්, විචක්ෂණශීලී සහ වෘත්තීමය හැසිරීම ශක්තිමත් කරනු ලබන වඩාත් යහපත් ආයතනික සංස්කෘතියක් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එක්ව ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සුදුසු අනුකූලතා සංස්කෘතියක් ගොඩනැගීම තහවුරු කිරීම සහ නියාමන ආයතනය වෙත නිර්වද්‍ය තොරතුරු සැපයීම සඳහා වගවීම.

(ඉ) නියාමන සහ අධීක්ෂණ අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම.

(ඊ) අධීක්ෂණ ගැටළු සහ අනුකූල නොවීම් සමඟ නියාමන අවශ්‍යතා හෝ අභ්‍යන්තර ප්‍රතිපත්ති කාලෝචිතව සහ යෝග්‍ය අයුරින් භාවිතය පිළිබඳ කටයුතු කිරීම.

(උ) 3.10 වන විධානයෙහි ප්‍රකාරව, වෙනත් සමාගමක විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු වීම හැර, තම සම්පූර්ණ වෘත්තීය සේවා කාලය ප්‍රධාන විධායක නිළධාරියෙකු විසින් මුදල් සමාගමේ කටයුතු වෙනුවෙන් යෙදවිය යුතු අතර, වෙනත් ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.

යන්න ඇතුළත් විය යුතුය.

**7. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්**

7.1 ආසන්න වශයෙන් මාසික කාල පරතරයකින්, මූල්‍ය වර්ෂයන් සඳහා අවම වශයෙන් දොළොස්වතාවක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතුය. ලේඛන සංසරණය කිරීමෙන් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් හැකිතාක් වැළකිය යුතුය.

7.2 නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කළ යුතුය.

7.3 නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින තුනකට පෙර දැනුම්දීමක් කළ යුතුය. අනෙකුත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා, සාධාරණ දැනුම්දීමක් යුතුය.

7.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සූදානම් වී සහභාගී වීම සඳහා අධ්‍යක්ෂකවරයෙකු විසින් ප්‍රමාණවත් කාලයක් වෙන් කළ යුතු අතර, අදහස් සහ යෝජනා ලබා දෙමින් සක්‍රීයව දායක විය යුතුය.

7.5 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවේ ගණ පූරණය රැස්ව සිටිය ද, අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවේ ගණ පූරණයෙන් අවම වශයෙන් හතරෙන් එකක් (¼) ස්වාධීන අධ්‍යක්ෂවරුන් නොවුණහොත්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නිසි පරිදි පැවැත්විය නොහැක.

7.6 අවශ්‍ය ලෙස සහ වසරකට දෙවරක් අවම වශයෙන් විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් තොරව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සමඟ සභාපතිවරයා විසින් රැස්වීම් පැවැත්විය හැකිය.

7.7 අධ්‍යක්ෂවරයෙකු හෝ ඥාතියෙකු හෝ ඔහුට සැලකිය යුතු බැඳියාවක් ඇති, බැඳියාවක් ඇති කරගැනීමට අපේක්ෂිත කාරණයක් හා සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක දී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අධ්‍යක්ෂවරයෙකු වැලකී සිටිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා වන ගණ පූරණයට ගණනය නොකළ යුතුය.

7.8 ආසන්නතම මාස 12ක කාල සීමාව තුළ පැවැත්වුණු රැස්වීම්වලින් අවම වශයෙන් තුනෙන් දෙකකට ($^2/_3$) හෝ අඛණ්ඩව පැවැත්වුණු රැස්වීම් තුනකට සහභාගී නොවූ අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමෙන් ඉවත් වනු ඇත. විකල්ප අධ්‍යක්ෂවරුන් සඳහා බලපානු ලබන විධානයන්ට යටත්ව, විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම සඳහා සහභාගී වීමෙන් පැමිණීම තහවුරු කිරීම පිළිගත හැකි වේ.

7.9 **නියමිත රැස්වීම් සහ නියමිත පරිදි සැලසුම් නොකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

නියමිත රැස්වීම් සඳහා පුද්ගලිකව සහභාගී වීම දිරිමත් කරන අතර කෙටි කාලීන දැනුම් දීමකින් අධ්‍යක්ෂවරයාහට පැමිණීමට අපහසු, පෙර සැලසුම් නොකරන ලද රැස්වීම් සඳහා විද්‍යුත් මාධ්‍ය හරහා සහභාගී වීම අනුමත කෙරේ.

**8. සමාගම් ලේකම්වරයා**

8.1 (අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කටයුතු මෙහෙයවීම සහ ව්‍යවස්ථාවන්ගේ සඳහන් අනෙකුත් කාර්යයන් සහ අනෙකුත් නියාමන පවත්වාගෙන යෑම මූලික වගකීමක් වන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස නම් කර ඇති සමාගම් ලේකම්වරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(ආ) පහත සඳහන් 19.2 හි සඳහන් අන්තර්කාලීන විධිවිධාන යටතේ මුදල් සමාගමක් විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 222 වන වගන්තිය ප්‍රකාරව, සමාගමක ලේකම්වරයෙකු සඳහා නිර්දේශිත සුදුසුකම් සහිත තැනැත්තෙකු පත් කළ යුතුය. මුදල් සමාගමේ ලේකම්වරයා ලෙස පත් කිරීමෙන් පසු, එවැනි තැනැත්තෙකු මුදල් සමාගමේ සේවකයෙකු වන අතර, මුදල් සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කරන තෙක්, වෙනත් ආයතනයක සේවකයෙකු නොවිය යුතුය.

8.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාපටිපාටි සහ අදාළ වන නීති, විධාන, රීති සහ නියාමනයන් අනුගමනය කිරීම තහවුරු කිරීම උදෙසා සමාගමේ ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්හට ප්‍රවේශය ලබා දිය යුතුය.

8.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සමාගමේ ලේකම්වරයා වෙත සභාපතිවරයා පවරා ඇත්නම්, එවැනි කාර්යයන් සම්පූර්ණ කිරීමේ වගකීම සමාගමේ ලේකම්වරයාහට පැවරේ.

8.4 සමාගමේ ලේකම්වරයා විසින් අවම වශයෙන් වසර 06 ක කාල සීමාවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල හඬ පටිගත කිරීම්/ වීඩියෝ පටිගත කිරීම් සහ/ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම් සමඟ රැස්වීම් වාර්තා පවත්වා ගත යුතුය. මණ්ඩලයට යවනු ලබන සියලු ඉදිරිපත් කිරීම් මෙයට ඇතුළත් විය යුතුය. සාධාරණ දැනුම් දීමකින්, ඕනෑම සාධාරණ අවස්ථාවක අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ඕනෑම අධ්‍යක්ෂවරයෙකු වෙත ලබා දීමට හැකි විය යුතුය.

8.5 රැස්වීම් වාර්තා ක්‍රමවත් ආකාරයකින් පවත්වාගෙන යෑම සඳහා සමාගම් ලේකම්වරයාට වගකීම පැවරෙන අතර මුදල් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් සුදුසු ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය.

**8.6** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම වගකීම් ඉටු කිරීමේ දී නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කර ඇත්දැයි වාර්තා මගින් දැන ගැනීම සඳහා හැකි වන අයුරින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත දක්වා ඇති විස්තර පැහැදිලිව අන්තර්ගත විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවක; (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡාවන්හී දී භාවිත කරනු ලබන දත්ත සහ තොරතුරු හි සාරාංශයක්; (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු; (ඇ) සෑම අධ්‍යක්ෂවරයෙකුම පුද්ගලිකව ලබා දෙන දායකත්වය ද ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව ඉටු කරන වග දක්වන කරුණු සෙවීමේ සාකච්ඡා සහ සම්මුතිය සහ විසම්මුතිය පිළිබඳ ගැටලු; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා අනුකූලතාවය සහ ප්‍රතිපත්ති සහ අදාළ නීති, නියාමන සහ විධාන අනුගමනය කරන අදාළ පාර්ශවයන්ගේ පැහැදිලි කිරීම් සහ සහතික කිරීම්; (ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ මුදල් සමාගම නිරාවරණය වන අවදානම හඳුනා ගැනීම සහ ප්‍රතිග්‍රහණය කරන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණයක්; සහ (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා.

**8.7** අධ්‍යක්ෂවරයෙකුගේ සාධාරණ දැනුම් දීමකින් රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීම සඳහා සාධාරණ කාලයක් ලබා දිය යුතුය.

**9. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යයන් පැවරීම**

**9.1** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය පැවරීම අනුමත කළ යුතු අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් තීරණ ගැනීමට පෙර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු කරුණු සම්බන්ධයෙන් පැහැදිලි විධාන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත මුදල් සමාගම වෙනුවෙන් ලබා දිය යුතුය.

**9.2** පහත 10 වන විධානයේ සඳහන් අනු කමිටු කිසිවක් නොමැති අවස්ථාවේ දී, එවැනි අනු කමිටු යටතේ නියම කර ඇති කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සිදු කර ගෙන යන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කළ යුතුය.

**9.3** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලදී සහාය ලබා දීමට නිසි අධිකාරිය පැවරීම සමඟ නිසි කළමනාකරණ මට්ටමේ අනු කමිටු පිහිටු වනු ඇත.

**9.4** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කාර්යයන් ඉටු කිරීමට සමස්තයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව, විධායක අධ්‍යක්ෂවරුන් නැතහොත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ හැකියාව සැලකිය යුතු ලෙස පීඩාවට ලක් කරනු ලබන නැතහොත් අඩු කරනු ලබන ප්‍රමාණයකට කිසිදු කාර්යයක් නොපැවරිය යුතුය.

**9.5** මුදල් සමාගමේ අවශ්‍යතාවලට අදාළව පැවරීම් ක්‍රියාවලිය පවතින බව තහවුරු කර ගැනීමට යොදවා ඇති පැවරීම් ක්‍රියාවලිය වාරාන්තර පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතුය.

**10. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු**

10.1 (අ) අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා අවශ්‍යතාවක් නිශ්චිතව දැක්වීමේ අරමුණ සඳහා, අවසන් වරට විගණනය කරන ලද ශේෂ පත්‍ර දිනට වත්කම් පදනම මත පදනම්ව මුදල් සමාගම් කොටස් දෙකකට බෙදනු ලැබේ. ඒවා නම්, 19.3 හි සඳහන් අන්තර් කාලීන විධිවිධානවලට යටත්ව, රුපියල් බිලියන 20 ට වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් සහ රුපියල් බිලියන 20 ට අඩු වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් වේ.

| | **රුපියල් බිලියන 20 ට වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම්** | **රුපියල් බිලියන 20 ට අඩු වත්කම් පදනමක් සහිත මුදල් සමාගම්** |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, නාම යෝජනා කමිටුව, මානව සම්පත් සහ වැටුප් කමිටුව සහ ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව | අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටු විය යුතුය. |
| රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සඳහා රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. වෙනත් කමිටු අවම වශයෙන් වාර්ෂිකව රැස්විය යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සඳහා රැස්වීම් අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. වෙනත් කමිටු අවම වශයෙන් වාර්ෂිකව රැස්විය යුතුය. |

(ආ) සෑම කමිටුවකට ම එහි අධිකාරය සහ රාජකාරීන් පැහැදිලිව සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිඛිත නිර්දේශ නියමයන් තිබිය යුතුය.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීමේ දී එක් එක් කමිටුවෙහි රාජකාරීන් සහ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සෑම කමිටුවක් ම කමිටුවෙහි සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ එහි රැස්වීම් සූදානම් කිරීමට, රැස්වීම් වාර්තා, හඬ හෝ වීඩියෝ පටිගත කිරීම් සහ එවැනි වෙනත් ලේඛනමය කටයුතු පවත්වා ගෙන යෑමට ලේකම්වරයෙකු පත් කළ යුතුය.

(ඉ) සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් ම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එවැනි

සාමාජිකයෙකු පත් කරන ලද කමිටුවෙහි වගකීම්වලට අදාළව කුසලතා, දැනුම සහ අත්දැකීම ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත විය යුතුය. අනිසි බල සාන්ද්‍රණය අවම කිරීමට සහ නව දෘෂ්ටිකෝණයන් ප්‍රවර්ධනය කිරීමට කලින් කලට සාමාජිකයන් සහ එවැනි කමිටුවල සභාපතිවරයා වෙනස් කිරීමට සලකා බලනු ඇත.

**10.2 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පහත දෑ අදාළ විය යුතුය.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සභාපතිවරයා ගිණුම්කරණය සහ/හෝ විගණනයෙහි සුදුසුකම් සහ අත්දැකීම් සතු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර, ඉන් බහුතරය අවශ්‍ය සුදුසුකම් සහ අත්දැකීම් සතු ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම් ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

**(ඈ) බාහිර විගණක කාර්යය**

i. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අදාළ ව්‍යවස්ථාවට අනුකූලව විගණන සේවාවන් සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම, විගණකවරයාගේ සේවා කාලය, විගණන ගාස්තු සහ ඕනෑම ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කිරීමකට අදාළව කරුණුවල දී නිර්දේශ සැපයිය යුතුය.

ii. විගණන හවුල්කරුවෙකුගේ ගිවිසුම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම අදාළ විගණන හවුල්කරු පූර්ව ධූර කාලය සම්පූර්ණ කිරීමේ දිනයේ සිට තෙවසරක් කල් පිරීමට ප්‍රථම විගණනය සඳහා යළි ගිවිස නොගත යුතුය. තවද, මුදල් සමාගම විසින් පිළිවෙලින් වසර දහයකට නොවැඩි කාලයක් සඳහා එකම බාහිර විගණන ආයතනයේ සේවය භාවිත නොකළ යුතුය.

iii. මුදල් සමාගමක විගණන හවුල්කරු කිසිදු මුදල් සමාගමක සැලකිය යුතු කොටස්කරුවෙකු, අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු නැතහොත් සේවකයෙකු නොවිය යුතුය.

iv. කමිටුව විසින් බාහිර විගණකවරයාගේ ස්වාධීනභාවය සහ විෂයානුබද්ධතාව සහ විගණන ක්‍රියාවලියන්හි සඵලදායීතාව අදාළ ප්‍රමිති සහ මනා භාවිතයන් සමාලෝචනය සහ අධීක්ෂණය කළ යුතුය.

v. විගණනය පවත්වා ගෙන යන එම වර්ෂය තුළ දී විගණන හවුල්කරුට මුදල් සමාගමේ වෙනත් විගණන නොවන සේවාවන් නොපැවරිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අදාළ නියාමන රාමුව යටතේ අවසර ලබා දී ඇති විගණන නොවන සේවා සැපයීමට බාහිර විගණන ආයතනයක ගිවිසුම මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රතිපත්තියක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කළ යුතුය. එලෙස සිදු කිරීමේ දී, විගණන නොවන සේවා ලබා දෙන බාහිර විගණන ආයතනයක සේවා සැපයීම මගින් බාහිර විගණකයාගේ ස්වාධීනභාවය සහ විෂයානුබද්ධතාවයට හානියක් සිදු නොකරන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

vi. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, විගණනය ඇරඹීමට පෙර, පහත කරුණු ඇතුළුව විගණනයේ ස්වභාවය සහ විෂය පථය සාකච්ඡා කර අවසන් කළ යුතුය. (i) මූල්‍ය වාර්තාකරණය මගින් කළමනාකරණයේ අභ්‍යන්තර පාලන සහ මෙම පනත යටතේ නිකුත් ලද විධාන සමග මුදල් සමාගමේ අනුකූලභාවයේ තක්සේරුවක්. (ii) අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරණ වගකීම් හා අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම; සහ (iii) එක් විගණකයෙකුට වැඩි ගණනක් කාර්යයෙහි නිරත වී සිටින විට විගණකයන් අතර සම්බන්ධීකරණය.

vii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මුදල් සමාගමක් එහි වාර්ෂික වාර්තා තුළ ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශ, අනාවරණය සඳහා පිළියෙල කළ ගිණුම් සහ කලින් කල ඉදිරිපත් කරන වාර්තාවල සහ ඒවායෙහි අඩංගු සුවිශේෂී මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් යනාදී එම මුදල් සමාගමෙහි මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම, මුදල් සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්, කලින් කල ඉදිරිපත් කරන වාර්තා සමාලෝචනය කිරීමේ දී, කමිටුව විසින් (i) ප්‍රධාන විනිශ්චයාත්මක අංශ; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන් තුළ සිදු කෙරෙන ඕනෑම වෙනස්කමක්; (iii) විගණනයෙන් හට ගන්නා සැලකිය යුතු ගැළපුම් (iv) අඛණ්ඩ පැවැත්ම උපකල්පනය; (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ වෙනත් නෛතික අවශ්‍යතා හා අනුකූල වීම යන කරුණු කෙරෙහි විශේෂයෙන් ම අවධානය යොමු කළ යුතුය.

viii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අතුරු සහ අවසන් විගණනවලින් හට ගන්නා විශේෂ නියමයන්, ගැටලු, ප්‍රශ්න මෙන්ම, අවශ්‍ය නම් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය නොමැති විට දී සාකච්ඡා කිරීමට අවශ්‍ය කරුණු ඇතුළුව, විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන ඕනෑම කරුණක් සාකච්ඡා කළ යුතුය.

ix. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බාහිර විගණකවරයෙකුගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයෙන් ඊට ලැබුණු ප්‍රතිචාරය එවැන්නක් යොමු කිරීමෙන් තෙමසක් ඇතුළත සමාලෝචනය කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීත්වය සමාලෝචනය අවම වශයෙන් වාර්ෂිකව සිදු කළ යුතුය.

(ඊ) මුදල් සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව විගණකවරුන් සහ අධීක්ෂණ ආයතන විසින් හඳුනා ගනු ලබන අභ්‍යන්තර පාලන දුර්වලතා, ප්‍රතිපත්ති වලට අනුකූල නොවීම, නීති සහ රෙගුලාසි හා වෙනත් ගැටලු සඳහා පිළියම් යෙදීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් කාලීන ආකාරයකින් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

(උ) **අභ්‍යන්තර විගණන කාර්යය**

i. මුදල් සමාගමේ අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය, යහපාලන පද්ධති සහ ක්‍රියාවලියන්හි ගුණාත්මකභාවය සහ සඵලදායීත්වය පිළිබඳ කමිටුව වෙත විෂයානුබද්ධතාව සහතික කිරීමක් සලසන ස්වාධීන අභ්‍යන්තර විගණන කාර්යයක් (ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම විධානයෙහි නියමකර ඇති විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර හෝ බාහිර) කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.

ii. අභ්‍යන්තර විගණන කාර්යයට පැහැදිලි විධි නියෝගයක් තිබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වගකිව යුතුය. මුදල් සමාගමකට ඔවුන්ගේ පැවරුම් සඵලදායීව සහ විෂය මූලිකව සිදු කර ගෙන යාමට එම ආයතනය තුළ ප්‍රමාණවත් ප්‍රවීණතාව සහ අධිකාරිය සතු විය යුතුය.

iii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මුදල් සමාගමෙහි අභ්‍යන්තර විගණන කාර්යයට පහත පියවර ගත යුතුය.

(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි විෂය පථය, කාර්යයන්, කුසලතා සහ සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවට එහි කාර්යයන් සිදු කර ගෙන යෑමට අවශ්‍ය බලතල පවතින බවට සහතික කිරීම.

(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විට දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත නිසි ක්‍රියාමාර්ග ගන්නා බවට තහවුරු කිරීම.

(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම.

(iv) අභ්‍යන්තර විගණන කාර්යය එය විගණනය සිදු කරන කාර්යයන්ගෙන් ස්වාධීන බවට සහ එය අපක්ෂපාතීව, ප්‍රවීණත්වයෙන් සහ නිසි වෘත්තීමය සැලකිල්ලෙන් සිදු කෙරෙන බවට තහවුරු කිරීම.

(v) අභ්‍යන්තර විමර්ශනයන්හි ප්‍රධාන සොයා ගැනීම් සහ ඊට කළමනාකරණය දැක් වූ ප්‍රතිචාර සලකා බලනු ලැබිය යුතු ය.

(ඌ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලීන ආකාරයකට ගෙන ඇති බවට තහවුරු කිරීම සහ කාර්තුමය වශයෙන් කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කළ යුතුය.

(එ) **කමිටුවේ රැස්වීම්**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සාකච්ඡා කිරීමට නියමිත ගැටලු සම්බන්ධ නිසි නිවේදනයක් සිදු කිරීමෙන්, ඉහත 10.1 හි නිශ්චිතව දක්වා ඇති පරිදි රැස් විය යුතු අතර, එහි යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ දී එය විසින් ගනු ලබන තීරණ වාර්තා කළ යුතුය.

i. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සාකච්ඡා කිරීමට නියමිත ගැටලු සම්බන්ධ නිසි නිවේදනයක් සිදු කිරීමෙන්, ඉහත 10.1 හි නිශ්චිතව දක්වා ඇති පරිදි රැස් විය යුතු අතර, එහි යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ දී එය විසින් ගනු ලබන තීරණ වාර්තා කළ යුතුය.

ii. වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හෝ වෙනත් ඕනෑම සේවකයෙකු ඔවුන්ගේ විෂය පථය යටතේ කරුණු සාකච්ඡා කිරීමේ දී කමිටුවෙහි ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වනු ඇත.

iii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් වෙනත් ඕනෑම අධ්‍යක්ෂවරයෙකු/ සේවකයෙකුගේ සහභාගීත්වයෙන් තොරව බාහිර විගණකවරුන් සමඟ අවම වශයෙන් වසරකට දෙවරක් හමුවිය යුතුය.

**10.3 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා සම්බන්ධව පහත දෑ අදාළ විය යුතුය.

(අ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සභාපතීත්වය දැරිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගෙන් සමන්විත විය යුතු අතර, බැංකුකරණය, මූල්‍යය, අවදානම් කළමනාකරණ ගැටලු සහ පරිචයන්හි දැනුම සහ අත්දැකීම් සහිත සාමාජිකයන් එහි ඇතුළත් විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් කළමනාකරුට ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ සමීපව කටයුතු කළ යුතු අතර, කමිටුවට පවරා ඇති අධිකාරීත්ව සහ වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.

(ආ) කමිටුවේ ලේකම් ලෙස ප්‍රධාන අවදානම් නිලධාරී කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ අවම වශයෙන්, මාස දෙකකට වරක් යන පදනම මත මුදල් සමාගම වෙත සියලු අවදානම්, එනම්, ණය වෙළඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම්, ක්‍රමෝපායික, අනුකූලතා සහ තාක්ෂණික යනාදී අවදානම් තක්සේරු කළ යුතු අතර, අවදානම් ක්‍රමෝපායන් සහ අවදානම් අභිරුචිය පිළිබඳ නිර්දේශ සැපයිය යුතුය.

(ඈ) මුදල් සමාගමක් විසින් එහි ක්‍රමෝපායික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට පිළිගනු ඇති හෝ ප්‍රතික්ෂේප කරනු ඇති අවදානම් වර්ග සහ පුද්ගල සහ ඒකාබද්ධ මට්ටම සම්බන්ධ කරන, අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශයක් ඔස්සේ මූල්‍ය සමාගමේ අභිරුචිය සංවර්ධනය කිරීම සහ නිර්වචනය කිරීම. කීර්තිය සහ අනුකූලතා අවදානම් මෙන්ම, මුදල් විශුද්ධිකරණය සහ සදාචාරාත්මක නොවන පරිචයන්ට පිළියම් යෙදීම සඳහා ඉපැයුම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව යනාදී කරුණුවලට සාපේක්ෂව ප්‍රකාශිත ප්‍රමාණාත්මක පියවර සහ ගුණාත්මක පියවර අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශයට ඇතුළත් විය යුතුය. මුදල් සමාගම ව්‍යාපාර ක්‍රමෝපාය අනුගමනය කිරීමේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ආකාරයට අනුව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය මගින් සීමාවන් සහ ව්‍යාපාර ප්‍රතිෂ්ඨාවන් ද නිර්වචනය කළ යුතු අතර, මුදල් සමාගම මුළුල්ලේ අවදානම් ගැටලු සහ ක්‍රමෝපායික සලකා බැලීම් මතු කිරීමට විධික්‍රම පිහිටුවීම සහ අවදානම් අභිරුචිය දෛනික මෙහෙයුම් තීරණ ගැනීම වෙත සම්බන්ධ කරමින් එය සන්නිවේදනය කළ යුතුය.

(ඉ) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවම වශයෙන් වාර්ෂිකව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය ඇතුළුව මූල්‍ය සමාගමෙහි අවදානම් ප්‍රතිපත්තීන් සමාලෝචනය කළ යුතුය.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නිශ්චිත කරනු ලැබූ පරිදි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ නිශ්චිත අවදානම් සඳහා පිළියම් යෙදීමට සහ එම අවදානම් කළමනාකරණය කිරීමට කළමනාකාරීත්ව මට්ටමේ කමිටුවල (ණය, වෙළඳපොල, ද්‍රවශීලතාව සහ මෙහෙයුම්) ප්‍රමාණාත්මකභාවය සහ සඵලදායීත්වය සමාලෝචනය කරනු ලැබිය යුතුය.

(උ) කමිටුව විසින් යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන සැලැසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු පැතිකඩ තක්සේරු කළ යුතුය.

(ඌ) කමිටුව විසින් අනුකූලතා නිලධාරීවරයාගේ සහ ප්‍රධාන අවදානම් නිලධාරීවරයාගේ කාර්යසාධනය වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

**(එ) අනුකූලතා කාර්යය**

i. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ව්‍යාපාර මෙහෙයුම්වල සියලු අංශ මත නීති, රෙගුලාසි, විධාන, රීති, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්තීන් සමඟ මුදල් සමාගම දක්වන අනුකූලත්වය තක්සේරු කිරීමට ස්වාධීන අනුකූලත්ව කාර්යයක් පිහිටුවිය යුතුය.

ii. රුපියල් බිලියන 20 ට වැඩි වත්කම් පදනමක් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා දෛනික කළමනාකරණයෙන් ස්වාධීන වන, ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස සැලකෙන, කැප වූ ප්‍රධාන අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කාර්යය සිදු කර ගෙන යා යුතු අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුව වාර්තා කළ යුතුය. අනුකූලතා නිලධාරියාට කිසිදු මෙහෙයුම් ව්‍යාපාර ක්‍රියාමාර්ග නැතහොත් ආදායම් උත්පාදන කාර්යයන් හා සම්බන්ධ කළමනාකාරීත්ව හෝ මූල්‍ය වගකීමක් සතු නොවන අතර, ද්විත්ව කාර්යයන් පැවරීම සිදු නොකළ යුතුය. එනම්, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී හෝ වෙනත් ඕනෑම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයක් අනුකූලතා නිලධාරියා ලෙස කටයුතු නොකළ යුතුය.

iii. රුපියල් බිලියන 20 ට වඩා අඩු වත්කම් පදනමක් සහිත මූල්‍ය සමාගම් සඳහා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය බවට සැලකෙන ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහිත නිලධාරියෙකු විවිධ අභිරුචීන් සඳහා මත ගැටුම් ඇති වීම වැළැක්වීමට අනුකූලතා නිලධාරියෙකු ලෙස පත් කළ යුතුය.

iv. අනුකූලතා නිලධාරියෙකුගේ වගකීම්වලට පුළුල් ලෙස පහත කරුණු ඇතුළත් වන බවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. (i) නියාමන අවශ්‍යතා උල්ලංඝනය කිරීමේ අවදානම තුරන් කිරීමට හෝ අවම කිරීමට සැලසුම් කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. (ii) සියලු මට්ටම්වල අනුකූලතා සංස්කෘතිය වර්ධනය කිරීමට මූල්‍ය සමාගමෙහි සියලු මට්ටම් වෙත අනුකූලතා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි පැහැදිලිව සන්නිවේදනය කෙරෙන බවට තහවුරු කිරීම; (iii) නියාමන රීති සහ අභ්‍යන්තර අනුකූලතා ප්‍රමිති සමඟ අනුකූලත්වය තක්සේරු කිරීමට සුදුසු වාර ගණනින් සමාලෝචන සිදු කෙරෙන බවට තහවුරු කිරීම; (iv) මුදල්

සමාගමෙහි ව්‍යාපාරයට අදාළ සියලු නව නෛතික සහ නියාමන සංවර්ධනයන් අවබෝධ කර ගැනීම සහ යෙදවීම; (v) නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර අනුකූලතාව සහ සදාචාරාත්මක වන නව නිෂ්පාදන සහ පද්ධති අනුකූල වන බව තහවුරු කිරීමට ඒවායෙහි සැලැස්ම සහ ව්‍යුහකරණය තුළ පූර්ව මැදිහත් වීම තහවුරු කිරීම; (vi) තදබල සහ නොනැවතී පවත්නා අනුකූලතා ගැටලු ඉස්මතු කර, සුදුසු අවස්ථාවක දී, ඒවා පිළිගත හැකි කාලයක් තුළ දී නිවැරදි කෙරෙන බව තහවුරු කිරීමට කළමනාකාරීත්වය සමඟ කටයුතු කිරීම; සහ (vii) පැහැදිලි හා කාලීන සන්නිවේදනයක් සහ උසස් අඛණ්ඩතාවක් සමඟ නියාමකයන්ගේ අරමුණු අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කර ගැනීම මත පදනම්ව, නියාමකයන් සමඟ ක්‍රමවත් සම්බන්ධතාවක් සහ යහපත් රැකියා සබඳතාවක් පවත්වා ගෙන යෑම.

(ඒ) අවදානම් කළමනාකරණ කාර්යය

i. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් මුදල් සමාගම හරහා අවදානම් ගැනීමේ කටයුතු කළමනාකරණය සඳහා වගකිව යුතු ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් පිහිටු විය යුතුය.

ii. රුපියල් බිලියන 20 ට වඩා වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් සඳහා වෙනම අවදානම් කළමනාකරණ දෙපාර්තුමේන්තුවක් පවත්වා ගෙන යෑම අපේක්ෂා කරන අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස සලකනු ලබන කැප වූ ප්‍රධාන අවදානම් නිලධාරියෙකු විසින් අවදානම් කළමනාකරණ කාර්යය සිදු කර ගෙන යෑම සහ වාරාන්තරව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම සිදු කළ යුතුය.

iii. මුදල් සමාගමෙහි අවදානම් කළමනාකරණ කාර්යය, එහි ක්‍රමෝපායික අරමුණු කරා සහාය දැක්වීමට ශක්තිමත් සහ සඵලදායී බව තහවුරු කිරීම සඳහා සහ විවිධ ඇල්මැති පාර්ශ්වයන් වෙත වඩා පුළුල් වගකීම් ඉටු කිරීමට අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය ඇතුළුව, මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම ප්‍රධාන අවදානම් නිලධාරියා සතු වේ.

iv. (i) විවිධ විභව අවදානම් සහ වංචා; (ii) එවැනි අවදානම් සහ වංචාව සිදු විය හැකි මූලාශ්‍ර; (iii) ආතති පරීක්ෂණය ආවරණය කරන, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණය ඇතුළත් වන එවැනි අවදානම් හඳුනා ගැනීමේ, තක්සේරු කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය; (iv) විචක්ෂණ මට්ටම්වල දී අවදානම් පාලනය සහ අවම කිරීමට ගනු ලබන සාර්ථක ක්‍රියාමාර්ග; සහ (v) එවැනි පාලන සහ අවම කිරීම් සඳහා වගකිව යුතු අදාළ නිලධාරීන් සහ කමිටු යන කරුණු ආවරණය කරන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන අවදානම් නිලධාරියා වගකිව යුතු බවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. මෙම රාමුව අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

v. ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සැලසුම්කරණය, නව නිෂ්පාදන සහ සේවා සංවර්ධනය යනාදී ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ද සහභාගී විය යුතු අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ නිර්දේශ සැපයිය යුතුය.

vi. ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් කාර්තුමය පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කළ යුතු යාවත්කාලීන කළ අවදානම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය.

vii. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, සමගාමීත්වය සහ/ හෝ නිශ්චිත විධාන ප්‍රකාශයට පත් කරන මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා වහාම අවදානම් තක්සේරු වාර්තාවක් යොමු කළ යුතුය.

**10.4 නාම යෝජනා කමිටුව**

නාම යෝජනා කමිටුවට පහත දෑ අදාළ වේ:

(අ) කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර, අභිමත පරිදි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියා හට කමිටුවෙහි ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය.

(ආ) නාමයෝජනා කමිටුවෙහි ලේකම් ලෙස සමාගම් ලේකම් කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය තෝරා ගැනීම/ පත් කිරීම සඳහා විධිමත් හා පාරදෘශ්‍ය ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා හැරුණු කොට, ප්‍රධාන අවදානම් නිලධාරියා සහ ප්‍රධාන අනුකූලතා නිලධාරියා, වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, අවශ්‍ය පරිදි ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය මත පත් කළ යුතුය.

(ඈ) අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයට අනුව ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සුදුසු සහ යෝග්‍ය බවට කමිටුව විසින් තහවුරු කළ යුතුය.

(ඉ) තෝරා ගැනීමේ ක්‍රියාවලියට යෝජිත අධ්‍යක්ෂවරුන්ට (i) අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට දැනුම, කුසලතා, අත්දැකීම, ස්වාධීනත්වය සහ විෂයානුබද්ධතාව සතු වන්නේ ද (ii)අවංකභාවය සහ හොඳ කීර්තියක් සතු වන්නේද (iii) ඔවුන්ගේ වගකීම් සම්පූර්ණයෙන් කර ගෙන යෑමට ප්‍රමාණවත් කාලයක් සතු වන්නේ ද යන්න සමාලෝචනය කිරීම ඇතුළත් විය යුතුය.

(ඊ) අධ්‍යක්ෂමණ්ඩල සංයුතිය සමස්තයක් ලෙස මුදල් සමාගමෙහි ඇල්මැති පාර්ශවයන්ගේ අවශ්‍යතා වලට අනර්ථයක් වන තත්ත්වයක් ඇති කරන ඕනෑම පුද්ගලයෙකු නැතහොත් පුද්ගලයන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමකින් බලනොපැවැත්වෙන බව තහවුරු කිරීමට කමිටුව උත්සාහ දැරිය යුතුය.

(උ) කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙහි තනතුරු සඳහා පත් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, අත්දැකීම සහ යෝග්‍යතාව සඳහා අවශ්‍ය වන නිර්ණායක සකස් කළ යුතුය.

(ඌ) නව අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම මත, මුදල් සමාගම විසින් වහාම කොටස්කරුවන් වෙත පහත දෑ අනාවරණය කළ යුතුයඃ (i) අධ්‍යක්ෂවරයා පිළිබඳ කෙටි හැඳින්වීමක් (ii) අදාළ ක්‍රියාකාරී අංශවල ප්‍රවීණතාවයේ ස්වභාවය; (iii) අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල අධ්‍යක්ෂභාවයන් සහ සාමාජිකත්වයන් දරන සමාගම්වල නම්; සහ (iv) එවැනි අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන බවට සැලකිය හැකි ද යන වග.

(එ) ඒකාබද්ධ වූ දැනුම, මුදල් සමාගම විසින් මුහුණ දෙන ලද ක්‍රමෝපායික ඉල්ලුම් කරා කාර්යසාධනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම උදෙසා අධ්‍යක්ෂවරයා විසින් සිදු කරනු ලබන දායකත්වය යන කරුණු සැලකිල්ලට ගනිමින්, කමිටුව විසින් දැනට සිටින අධ්‍යක්ෂවරුන් යළි තොරා පත් කිරීමට සලකා බැලීම සහ නිර්දේශ කිරීම (නැතහොත් නිර්දේශ නොකිරීම) සිදු කරනු ලැබිය යුතුය.

(ඒ) කමිටුව විසින් අතිරේක/ නව ප්‍රවීණතාව සඳහා වන අවශ්‍යතාවන් සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා අනුප්‍රාප්ති සැකසුම් කලින් කලට සලකා බැලීම සහ නිර්දේශ කරනු ලැබීම සිදු කළ යුතුය.

(ඓ) නාම යෝජනා කමිටුවෙහි සාමාජිකයෙකු ස්වකීය පත් කිරීම/ යළි පත් කරනු ලැබීමට අදාළව තීරණ ගැනීම සඳහා සහභාගී නොවිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපතිවරයා අනුප්‍රාප්තිකයකු පත් කිරීම සම්බන්ධව කටයුතු කරන කමිටුවක දී එහි සභාපතීත්වය නොදැරිය යුතුය.

## 10.5 මානව සම්පත් සහ වැටුප් කමිටුව

මානව සම්පත් සහ වැටුප් කමිටුවට පහත දෑ අදාළ විය යුතුය.

(අ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් කමිටුවේ සභාපතීත්වය දරනු ලැබිය යුතු අතර, සාමාජිකයන්ගෙන් බහුතරය විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගෙන් සමන්විත විය යුතුය.

(ආ) මානව සම්පත් සහ වැටුප් කමිටුවෙහි ලේකම් ලෙස සමාගම් ලේකම් කටයුතු කිරීම සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් මුදල් සමාගමෙහි විධායක අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මෙන්ම, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ දීමනා ව්‍යුහයට අදාළව වැටුප් ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා, සහ වෙනත් මූල්‍ය ගෙවීම්) නියම කරනු ලැබිය යුතුය.

(ඈ) වැටුප් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ දී විධිමත් සහ පාරදෘශ්‍ය ක්‍රියාමාර්ගයක් තිබිය යුතුය.

(ඉ) කමිටුව විසින් මුදල් සමාගමෙහි සියලු සේවකයන් සඳහා වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය දිරි දීමනා ගෙවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා වැටුප් ප්‍රතිපත්තිය නිර්දේශ කරනු ලැබිය යුතුය. වැදගත් වෙනස් වීම් සිදු කළ අවස්ථා ද ඇතුළුව, මෙම ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ කලින් කලට සිදු කෙරෙන සමාලෝචනයට යටත් විය යුතුය.

(ඊ) වැටුප් ව්‍යුහය මුදල් සමාගමෙහි ව්‍යාපාර ක්‍රමෝපාය, අරමුණු, අගයන්, දිගු කාලීන අභිලාෂ සහ පිරිවැය ව්‍යුහය හා අනුකූල විය යුතුය. බැඳියාවන් අතර ගැටුම් වැළැක්වීම සඳහා පියවර ද එහි ඇතුළත් විය යුතුය. විශේෂයෙන්ම, වැටුප් ව්‍යුහයන් හා සම්බන්ධ කර තිබෙන දිරි දීමනා මගින් කාර්ය මණ්ඩලය අධික අවදානම් ගැනීමට නැතහොත් ස්වයං අභිලාෂයෙන් ක්‍රියා කිරීමට පෙළඹ වීම සිදු නොකළ යුතුය.

(උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම වශයෙන් වාර්ෂිකව අනුමත කර ඇති ඉලක්ක සහ අභිමතාර්ථවලට එරෙහිව කමිටුව විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්යසාධනය (ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී හැරුණු කොට) සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, වැටුප්, ප්‍රතිලාභ සහ කාර්යසාධනය පදනම් කර ගත් දිරිදීමනාවන්හි වෙනත් ගෙවීම් ප්‍රතිශෝධනය සඳහා පදනම නිර්ණය කළ යුතුය.

(ඌ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කමිටු රැස්වීම්වලදී ඔවුනට සම්බන්ධ කරුණු සාකච්ඡා කරන විට දී, එම රැස්වීම්වලට සහභාගී වීමෙන් වැළකී සිටින බවට කමිටුව විසින් තහවුරු කළ යුතුය.

**11. අභ්‍යන්තර පාලන**

**11.1** මුදල් සමාගම් විසින් සංවිධානාත්මක ව්‍යුහය, රාජකාරී කටයුතු බෙදා වෙන් කිරීම, පැහැදිලි කළමනාකරණ වාර්තා කිරීමේ මාර්ග සහ මෙහෙයුම් අවදානම් අවම කිරීම සඳහා ප්‍රමාණවත් මෙහෙයුම් ක්‍රියාමාර්ග ඇතුළත් වන, මනා ලෙස පිහිටුවන ලද අභ්‍යන්තර පාලන පද්ධතියක් අනුගමනය කළ යුතුය.

**11.2** නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් මගින්: (අ) සඵලදායී සහ කාර්යක්ෂම මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම; (ආ) විශ්වසනීය මූල්‍ය තොරතුරු සැපයීම; (ඇ) වත්කම් සුරැකීම; (ඈ) අක්‍රමිකතා, වංචා සහ දෝෂවලින් හට ගන්නා මෙහෙයුම් අවදානමෙන් අත් වන අලාභ අවම කිරීම; (ඉ) සඵලදායී අවදානම් කළමනාකරණ පද්ධති තහවුරු කිරීම; සහ (ඊ) අදාළ නීති, රෙගුලාසි, විධාන සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම සිදු කළ යුතුය.

**11.3** සියලු සේවකයන් හට අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ වගවීමෙහි කොටසක් ලෙස අභ්‍යන්තර පාලන සඳහා වගකීම ලබා දිය යුතුය.

**12. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**

**12.1** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා පහත කරුණු ආවරණය කරන ප්‍රතිපත්තියක් පිහිටුවනු ලැබිය යුතුය.

(අ) සියලු මුදල් සමාගම් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටුවිය යුතු අතර, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු එහි සභාපතිවරයා විය යුතු අතර එහි සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.

(ආ) සියලු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පූර්ව සමාලෝචනයට ලක් කර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබිය යුතුය.

(ඇ) මෙම විධානය තුළ ආවරණය කෙරෙනු ලබන සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ සිදු කරන ව්‍යාපාර ගනුදෙනු පහත ඒවා වේ:

i. පහසුකම් සැලසීම.
ii. තැන්පතු, ණය ගැනීම් සහ වෙනත් ඕනෑම ගෙවිය යුතු දෑ යන ස්වරූපයෙන් මුදල් සමාගම වෙත වගකීම් නිර්මාණය කිරීම.
iii. මුදල් සමාගම වෙත මූල්‍ය හෝ මූල්‍ය නොවන සේවා සැපයීම හෝ මුදල් සමාගමෙන් එම සේවා ලබා ගැනීම.
iv. මුදල් සමාගම සහ පොදු විෂය පථය තුළ නොතිබෙන හිමිකාරීත්ව, රහස්‍ය හෝ තොරතුරු හෝ එවැනි සම්බන්ධිත පාර්ශ්වයකට ප්‍රතිලාභ ලබා දෙන සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු වන ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ නිර්මාණය කිරීම හෝ පවත්වා ගෙන යෑම.

12.2 ඕනෑම පුද්ගලයෙකු සමඟ සහ විශේෂයෙන් ම මෙම විධානයේ අරමුණු සඳහා "සම්බන්ධිත පාර්ශ්වයන්" ලෙස සැලකිය යුතු පහත පුද්ගල වර්ගයන් සමඟ මුදල් සමාගමක ඕනෑම ගනුදෙනුවකින් හට ගත හැකි ඕනෑම බැඳියාවන් අතර ගැටුමක් වැළැක්වීමට කමිටුව විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුය. මේ හා සම්බන්ධව, අවශ්‍ය වූ විට කලින් කලට සමාලෝචනයට යටත් වන සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස හඳුනා ගත් ස්වභාවික පුද්ගලයන්/ආයතනයන්හි නාම ලැයිස්තුවක් පැවතිය යුතුය.

(අ) අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

(ආ) ඍජු හෝ වක්‍ර සියයට 10 ට වඩා ඡන්ද අයිතිය හිමි කොටස්හිමියන්

(ඇ) මුදල් සමාගම විසින් පාලනය කරනු ලබන පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්, අනුබද්ධ සමාගම් (සහෝදර සමාගම්), පාලක සමාගම්, අවසාන මව් සමාගම් සහ වෙනත් ඕනෑම පාර්ශ්වයක් ( ඔවුන්ගේ පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්, අනුබද්ධ සමාගම් ඇතුළුව) සහ ඊට ප්‍රතිලෝම වශයෙන්.

(ඈ) ඡේද (ආ) හෝ (ඇ) හි නෛතික පුද්ගලයන්ගේ අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

(ඉ) ඡේද (අ), (ආ) හෝ (ඈ) හි විස්තර කර ඇති ස්වභාවික පුද්ගලයන්ගේ ඥාතීන්

(ඊ) මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හෝ මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරයාගේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ හෝ ඡන්ද අයිතිවාසිකම්/ සැලකිය යුතු සම්බන්ධතාවක් පවතින සියයට 10 කට වඩා වැඩි හිමිකාරීත්වයක් දරන එහි කොටස් හිමියන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ඕනෑම කරුණක්

12.3 මෙම මුදල් සමාගම කිසිදු සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ එම සමාගමෙහි වෙනත් සමාන ගනුදෙනුකරුවන්ට වඩා සම්බන්ධිත පාර්ශව සඳහා "වඩාත් වාසිදායක සැලකිල්ලක්" සහිත ව්‍යාපාර ගනුදෙනුවල කිසිදු ආකාරයකින් නිරත නොවන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. මෙම ඡේදයේ අරමුණු සඳහා, 'වඩාත් හිතකර සැලකිල්ලක්' වශයෙන් පහත දෑ අදහස් විය යුතුය.

(අ) කමිටුව විසින් තීරණය කර ඇති පරිදි, මුදල් සමාගම් නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතයක් ඉක්මවා යන, 'සමස්ත පහසුකමක්' සම්බන්ධිත පාර්ශ්වයකට ලබා දීම.

(ආ) අඩු පොලී අනුපාතිකයක් අය කිරීම හෝ සම්බන්ධිත නොවන සැසඳිය හැකි ප්‍රතිපාර්ශ්වයක් සමඟ සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා ගෙවනු ලබන අනුපාතිකය අභිබවා යන පොලී අනුපාතිකයක් ගෙවීම.

(ඇ) සම්බන්ධිත නොවන පාර්ශ්ව සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලබා දුන් නියමයන්ට ඔබ්බෙන් දීර්ඝ කෙරෙන, වාසිදායක නියමයන් වැනි පක්ෂපාතී සැලකිල්ලක් ලබා දීම.

(ඈ) නිසි ඇගයීමේ ක්‍රියාමාර්ගවලින් තොරව සම්බන්ධිත පාර්ශ්වයක් වෙත සේවාවන් සැපයීම හෝ සම්බන්ධිත පාර්ශ්වයකගෙන් සේවාවන් ලබා ගැනීම; හෝ

(ඉ) නෛතික රාජකාරී සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වූ විට හැරුණු කොට, සම්බන්ධිත පාර්ශ්වයකට ප්‍රතිලාභ ලබා දෙනු ඇති හිමිකාරීත්ව, රහස්‍යභාවීය හෝ සංවේදී තොරතුරු බෙදා ගැනීමට ඉඩ සලසනු ඇති, මුදල් සමාගම සහ ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයක් අතර වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ පවත්වා ගෙන යෑම.

**13. සමූහ යහපාලනය**

**13.1 පාලක සමාගමක් ලෙස මුදල් සමාගමක වගකීම්**

(අ) මුදල් සමාගම විසින් පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වලට අදාළ වන ස්වාධීන, නෛතික, නියාමන සහ යහපාලන වගකීම්වලට අනුකූල වන අතරතුර, ඒවා ප්‍රමාණවත් පරිදි පාලනය කිරීම සඳහා වගකියනු ලැබේ.

(ආ) මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්:

i. සමූහයේ පාලන රාමුව මගින් සමූහයේ පුළුල් ප්‍රතිපත්ති පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කෙරෙන බවට තහවුරු කිරීම.

ii. එක් එක් සමාගම සඳහා වන නෛතික සහ නියාමන අවශ්‍යතා ඇතුළුව, මෙහෙයුම් පරිසරය තුළ පවතින වෙනස්කම් තහවුරු කිරීම සඳහා සමූහයේ පාලන රාමුව තුළ නිසි ආකාරයෙන් අවබෝධ කොට, පිළිබිඹු කෙරෙන බවට තහවුරු කිරීම.

iii. පාලක මුදල් සමාගමට සහ එහි පාලිත සමාගම්වලට බලපානු ඇති සැලකිය යුතු අවදානම් සහ ප්‍රවණතාවන් අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට නිසි වාර්තාකරණ සැකසුම් යෙදීම.

iv. අභ්‍යන්තර පාලන රාමුව මගින් අභ්‍යන්තර සමූහයේ ගනුදෙනුවලින් හට ගන්නා අවදානම් ඇතුළුව, සමූහය පුරා හට ගන්නා අවදානම් සඳහා ප්‍රමාණවත් පරිදි පිළියම් යෙදෙන බවට තක්සේරු කිරීම. සහ

v. අදාළ වන සියලුම නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ මුදල් සමාගම සහ එහි පාලිත සමාගම්වල අනුකූලතාව සාර්ථකව අධීක්ෂණය කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට තහවුරු කිරීම.

(ඇ) අග්‍රස්ථ ආයතනය ලෙස, මෙම මුදල් සමාගම විසින් සමූහයේ ව්‍යුහය මගින් සඵලදායී පාලනයක් ක්‍රියාත්මක කිරීමට එය සතු හැකියාව අවතක්සේරු නොකෙරන බවට තහවුරු කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කළමනාකරණය යටතේ නව නෛතික ආයතන නිර්මාණය අනුමත කිරීම පැහැදිලිව නිර්වචනය කළ ක්‍රියාවලියක් පිහිටුවිය යුතු අතර, ප්‍රමාණවත් සහ සාර්ථක ප්‍රතිපත්ති සහ පාලන ඔස්සේ සමූහයේ සියලු සැලකිය යුතු පුළුල් අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය සිදු කළ යුතුය.

(ඈ) සමූහය මට්ටමින් සකස් කළ අරමුණු, ක්‍රමෝපායයන්, ප්‍රතිපත්ති සහ පාලන රාමු මුදල් සමාගමෙහි නියාමන වගකීම් සමඟ සම්පූර්ණයෙන් අනුරූප වන බවට මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සත්‍යාපනය කළ යුතු අතර, සමාගමට නිශ්චිත අවදානම් සඳහා ප්‍රමාණවත් පරිදි පිළියම් යෙදෙන බවට තහවුරු කළ යුතුය.

(ඉ) මුදල් සමාගම විසින් මෙහෙයුම්වල සංකීර්ණභාවය සැලකිය යුතු අයුරින් ඉහළ නැංවිය හැකි, ආර්ථික හරය හෝ ව්‍යාපාර අරමුණ ඌණ වූ සංකීර්ණ ව්‍යුහ සකස් කිරීම අවම කළ යුතුය.

**13.2 පාලිත සමාගමක් ලෙස වගකීම්**

මුදල් සමාගම විචක්ෂණ නියාමනයට යටත්ව, තවත් මුදල් සමාගමක පාලිත සමාගමක් වන්නේ නම්, මුදල් සමාගම විසින් එහි ස්වකීය නෛතික සහ පාලන වගකීම් ඉටු කළ යුතුය.

**14. ආයතනික සංස්කෘතිය**

**14.1** මුදල් සමාගමක් විසින් මනා හැසිරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් වන සහ රහස්‍යභාවය, බැඳියාවන් අතර ගැටුම, වාර්තාකරණයේ ඍජු බව, ආරක්ෂාව සහ සමාගම් වත්කම්වල නිසි භාවිතය සහ පාරිභෝගිකයන්ට සාධාරණව සැලකීම හා සම්බන්ධ ගැටලු ඇතුළත් වන ආචාර ධර්ම පද්ධතියක් අනුගමනය කළ යුතුය.

**14.2** මුදල් සමාගම විසින් ආචාර ධර්ම පද්ධති උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තා පවත්වා ගෙන යා යුතු අතර, එවැනි උල්ලංඝනය කිරීම් සඳහා ආමන්ත්‍රණය කිරීමෙන් අඛණ්ඩතාවයේ උසස් ප්‍රමිතීන් රැකීම සිදුවේ.

14.3 මුදල් සමාගමක් විසින් විෂය මූලිකව විමර්ශනය කිරීමට සහ පිළියම් කිරීමට නියමිත නීත්‍යානුකූල ගැටලු සඳහා තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් (Whistleblowing Policy) පිහිටුවිය යුතුය. සේවකයන්ට නීති විරෝධී, සාදාචාරාත්මක නොවන හෝ විශ්වසනීයත්වයෙන් සහ ප්‍රති හිංසනයකින් තොරව ප්‍රශ්න කළ හැකි පරිචයන් පිළිබඳ ගැටලු මතු කිරීමට හැකි විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කළ යුතුය.

**15. බැඳියාවන් අතර ගැටුම**

15.1 (අ) අධ්‍යක්ෂවරුන් අතර පවත්නා සම්බන්ධතාවයන් මගින් අනිසි බලපෑමක් හෝ බල කිරීම් ඇති නොකළ යුතුය. අධ්‍යක්ෂවරයෙකු විසින් එවැනි අධ්‍යක්ෂවරයෙකු හෝ ඕනෑම ඥාතියෙකුගෙන් ඕනෑම අයෙකු සැහෙන සම්බන්ධතාවයක් දැක්වූ සැහෙන සම්බන්ධතාවයක් දක්වන කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයකට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිය යුතුය. එමෙන්ම, එවැනි අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙහි අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා ගණ පූරණයෙහි ගණනය නොකළ යුතුය.

(ආ) සම්බන්ධිත පාර්ශ්ව සමඟ ඇති විය හැකි බැඳියාවන් අතර ගැටලුවලට පිළියම් යෙදීමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් ලිඛිත ප්‍රතිපත්තියක් මෙන්ම, විෂය මූලික අනුකූලතා ක්‍රියාවලියක් තිබිය යුතුය. මෙම ප්‍රතිපත්තිය මගින්,

i. බැඳියාවන් අතර ගැටලු ඇති වීමට හේතු වන හෝ බැඳියාවන් අතර ගැටලුවලින් සමන්විත වන සිද්ධීන් හඳුනා ගැනීම.

ii. බැඳියාවන් අතර ගැටලු නිර්මාණය කරනු ඇති ක්‍රියාකාරකම් හැකිතාක් මට්ටමකට වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීම ප්‍රකාශ කිරීම.

iii. බැඳියාවන් අතර ගැටලුවකට තුඩු දෙන, සිදුවීමක ඕනෑම වෙනස් වීමක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා වන ක්‍රියාවලිය නිර්වචනය කිරීම.

iv. අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් බැඳියාවන් අතර ගැටලු ඇති වීමට හේතු විය හැකි ඇතැම් ක්‍රියාවල නිරත වීමට පෙර, ඔවුන් සඳහා දැඩි සමාලෝචනයක් සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

v. සම්බන්ධිත පාර්ශ්ව සමඟ බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ යාවත්කාලීන කරන ලද වාර්තා පවත්වා ගෙන යෑම සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීම.

vi. මෙම ප්‍රතිපත්තිය සමඟ සිදු කරන ඕනෑම අනුකූල නොවීමකට පිළියම් යෙදිය හැක්කේ කෙසේද යන්න පැහැදිලි කිරීම,

සිදු කරනු ලැබිය යුතුය.

**16. අනාවරණය කිරීම්**

16.1 (අ) වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ වාරාන්තර මූල්‍ය ප්‍රකාශ, නියාමන සහ අධීක්ෂණ අධිකාරයන් සහ අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති මගින් නියම කොට ඇති ආකෘති හා අනුකූලව සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කරන බවට ද, (ආ) එවැනි ප්‍රකාශ

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල පළ කෙරෙන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම වශයෙන් පහත සඳහන් කරුණු වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කළ යුතුය.

| විෂය | අනාවරණය කිරීම |
|---|---|
| i. මූල්‍ය ප්‍රකාශ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හෝ අදාළ ප්‍රමිතියකට අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශ කට්ටලයට අමතරව, වාර්ෂික වාර්තාවෙහි පහත දෑ ඇතුළත් විය යුතුය.<br>• වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ නිශ්චිත අනාවරණය කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතා හා අනුකූලව පිළියෙල කර ඇති බවට ප්‍රකාශයක්.<br>• මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමෙහිලා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශයක්. |
| ii. සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය ආශ්‍රිත අනාවරණයන් | • නම, සුදුසුකම් සහ කෙටි විස්තරයක්<br>• විධායක, විධායක නොවන සහ/ හෝ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ද යන වග.<br>• ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂවරයාගේ විස්තර කිසිවක් ඇත්නම්.<br>• අදාළ ක්‍රියාකාරී අංශයෙහි පවත්නා ප්‍රවීණතාවෙහි ස්වභාවය<br>• ඥාතීන් සහ/හෝ සමාගමේ වෙනත් අධ්‍යක්ෂවරුන් සමඟ පවත්නා ඕනෑම ව්‍යාපාර ගනුදෙනු සබඳතා.<br>• සලකා බලනු ලබන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන වෙනත් සමාගම්වල නම් සහ විධායක හෝ විධායක නොවන ධාරිතාවෙන් ද යන වග.<br>• වර්ෂය තුළ දී සහභාගී වන ලද මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල |

| | | |
|---|---|---|
| | | රැස්වීම් ගණන/ එහි ප්‍රතිශතය; සහ<br>• අධ්‍යක්ෂවරයා සභාපතිවරයෙකු ලෙස හෝ සාමාජිකයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල නම්. |
| iii. | අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම | • අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි කමිටුවල කාර්යසාධන තක්සේරු කිරීම කෙසේ සිදු කර තිබෙන්නේ ද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක්. |
| iv. | වැටුප් | • අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු ව්‍යුහය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වැටුප් බෙදා දැක්වීම, වැටුප් මට්ටම සහ මිශ්‍රය (මූල්‍ය සහ මූල්‍ය නොවන, වැටුප් සැකසීම සඳහා වන ක්‍රියාමාර්ගය සහ වැටුප්, කාර්යසාධනය සහ අගය නිර්මාණය අතර සබඳතා ඇතුළත් වන වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශයක්).<br>• මුදල් සමාගම විසින් එහි අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත ගෙවන ලද වැටුපෙහි ඒකාබද්ධ අගයන්. |
| v. | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු | • සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර කිසිදු සබඳතාවක් ඇත්නම්, ඒවායෙහි ස්වභාවය [මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් සැලකිය යුතු/ අදාළ සබඳතාව(සබඳතාවන්)] සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතර සබඳතාවන්.<br>• මුදල් සමාගමෙහි මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස සම්බන්ධිත පාර්ශ්වයන්ගේ එක් එක් වර්ගයට අදාළව ගෙවීමට තිබෙන ශුද්ධ පහසුකම් සහ සම්බන්ධිත පාර්ශවය හෝ එක් එක් වර්ගයට අදාළව ප්‍රදානය කරන ලද සමස්ත ශුද්ධ පහසුකම්. |

| | | |
|---|---|---|
| vi. | අධ්‍යක්ෂ මණ්ඩල විසින් පත් කරන ලද කමිටු | • සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සාමාජිකයන්ගේ විස්තර සහ එවැනි රැස්වීම් සඳහා සහභාගී වීම. |
| vii. | සමූහයේ ව්‍යුහය | • මුදල් සමාගම ක්‍රියාත්මක වන සමූහයේ ව්‍යුහය<br>• සමූහයේ යහපාලන රාමුව |
| viii. | අධ්‍යක්ෂවරයාගේ වාර්තාව | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ පහත ප්‍රකාශයන්ගෙන් සමන්විත වාර්තාවක්:<br>• මුදල් සමාගම නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන කිසිදු කටයුත්තක නොයෙදී ඇත.<br>• අධ්‍යක්ෂවරුන් මුදල් සමාගම සමඟ සියලු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රකාශ කර ඇති අතර, ඔවුන් සැලකිය යුතු මට්ටමින් උනන්දුවක් දැක් වූ කරුණු මත ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිට ඇත.<br>• මුදල් සමාගම විසින් විශේෂයෙන් ම තැන්පත්කරුවන් ඇතුළුව, සියලු පාර්ශ්වකරුවන්ට සාධාරණව සැලකීමට සියලු ප්‍රයත්නයන් ගෙන ඇත.<br>• ආධාරක උපකල්පන සමඟ මෙම ව්‍යාපාරය අඛණ්ඩ පැවැත්මක තිබේ.<br>• අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් සමාගම වෙත පවතින සැලකිය යුතු අවදානම් ආවරණය කරනු ලබමින්, අභ්‍යන්තර පාලනයන්හි සමාලෝචනයක් සිදු කර ඇති අතර, ඔවුන්ගේ සඵලදායීත්වය වෙනුවෙන් සෑහෙන සහතික කිරීමක් ලබා ගෙන ඇත. |

| | | |
|---|---|---|
| ix. | අභ්‍යන්තර පාලන පිළිබඳ ප්‍රකාශය | • මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධව සෑහෙන සහතික කිරීමක් ලබා දීමට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කොට ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලව සිදු කර ඇති බවට තහවුරු කරන මුදල් සමාගමෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන වාර්තාවක්.<br>• පිළියෙළ කළ හෝ ප්‍රකාශයට පත් කළ ඕනෑම ප්‍රකාශනයකට අදාළව, උක්ත සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලදායීත්වය පිළිබඳව බාහිර විගණකගේ සහතිකකරණ ප්‍රකාශය.<br>• විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්හි අනුකූලතාව පිළිබඳ විස්තර සහ ඕනෑම අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ගවල විස්තර දක්වන වාර්තාවක්.<br>• මුදල් සමාගමෙහි අවදානම් කළමනාකරණය තුළ හට ගන්නා ප්‍රමාද දෝෂ පිළිබඳව හෝ මෙම පනත, රීතීන් සහ විධාන සමඟ අනුකූල නොවීම හා සම්බන්ධව නියාමන සහ අධීක්ෂණ ගැටලු දක්වන ප්‍රකාශයක්. |
| x. | ආයතනික යහපාලන වාර්තාව | • සමාගම ආයතනික යහපාලන විධානය සමඟ කොතෙක් දුරට අනුකූලව ක්‍රියා කොට ඇත් ද සහ එම ආකාරය සහ ආයතනික යහපාලන විධානය සමඟ අනුකූල වීමේ බාහිර විගණකවරයාගේ සහතිකකරණ ප්‍රකාශය. |

| | |
|---|---|
| xi. ආචාර ධර්ම පද්ධතිය | • අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ සේවකයන් සඳහා මුදල් සමාගමෙහි ව්‍යාපාර ආචාර ධර්ම සහ ආචාර ධර්ම.<br>• සමාගම විසින් මෙම සංග්‍රහයේ කිසිදු විධිවිධානයක් උල්ලංඝනය කර නොමැති බවට සභාපතිවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතුය. |
| xii. කළමනාකරණ වාර්තාව | • කර්මාන්ත ව්‍යුහය සහ සංවර්ධන<br>• අවස්ථා සහ තර්ජන<br>• අවදානම් සහ සැලකිලිමත් විය යුතු කරුණු<br>• සමාගම විසින් සිදු කර ගෙන යනු ලබන තිරසාරාත්මක මූල්‍ය කටයුතු<br>• අනාගතය සඳහා අපේක්ෂා |
| xiii. කොටස් හිමියන් සමඟ සන්නිවේදනය | • කොටස් හිමියන් සමඟ සන්නිවේදනය සඳහා වන ප්‍රතිපත්තිය සහ ක්‍රමවේදය.<br>• එවැනි සන්නිවේදනයක් සඳහා සම්බන්ධ කර ගත යුතු පුද්ගලයා. |

**17. නිර්වචන**

“පනත” යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හෝ එහි සංශෝධන යන්න අර්ථවත් විය යුතුය.

මුදල් සමාගමකට අදාළව “අනුබද්ධිත ආයතනයක්” යන්නෙන් එම මුදල් සමාගම ඍජුව හෝ වක්‍රව පාලනය කරන, හෝ එම මුදල් සමාගම සමඟ පොදුවේ පාලනය යටතේ සිටින සංස්ථාවක් යන්න අදහස් කෙරෙන අතර, පාලිත සමාගමක්, ආශ්‍රිත සමාගමක්, පාලක සමාගමක්, පොදු කාණ්ඩය යටතේ සමාගම් ඊට ඇතුළත් වේ.

“අධ්‍යක්ෂ මණ්ඩලය” යන්නට විධායක අධ්‍යක්ෂවරුන් ඇතුළත් හෝ එසේ නොමැති නම් විකල්ප අධ්‍යක්ෂවරුන් ද ඇතුළත් විය යුතුය.

“ඥාතියෙකු” යනු මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියේ දැක්වෙන අදහසට සමාන අදහසක් දැක්වේ.

“ඍජු හෝ වක්‍ර කොටස්හිමිකාරීත්වය” යනු සමාගමක, සංස්ථාපිත ආයතනයක, හෝ තනි පුද්ගලයෙකු, හෝ,

අ. සමාගමක් සහ පහත සඳහන් ඒවායින් එකක් හෝ කිහිපයක්:

i. එහි පාලිත සමාගම්.

ii. එහි පාලක සමාගම.

iii. එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

iv. එම සමාගම හෝ එහි පාලිත සමාගම් හෝ එහි පාලක සමාගම් හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවක් දරන සමාගමක් හෝ;

ආ. තනි පුද්ගලයෙකු සහ පහත දැක්වෙන අය හෝ වැඩි ගණනක් විසින්;

i. ඥාතීන්

ii. ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ ඥාතියෙකු සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; එවැනි සමාගමක පාලිත සමාගමක්; එවැනි සමාගමක පාලක සමාගමක්; එවැනි සමාගමක පාලක සමාගමේ පාලිත සමාගමක්; එවැනි සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවයක් සහිත සමාගමක් හෝ එහි පාලිත සමාගම, හෝ එහි පාලක සමාගම, හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

iii. සමාගමක් හැර, එවැනි පුද්ගලයෙකු; හෝ ඔහුගේ/ඇයගේ ඥාතියෙකු සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සංස්ථාපිත ආයතනයක්; හෝ සෘජුව, වක්‍රව, හෝ වාසිදායක ලෙස සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ සැලකිය යුතු කළමනාකරණ සම්බන්ධතාවයක් යන බැඳියාවන් අතුරින් එකක් සහිත, තනි පුද්ගලයෙකු හෝ සමාගමක් සහිත සමාගමක්,

විසින් සමස්තයක් ලෙස රඳවා තබා ගනු ලැබූ ඡන්ද අයිතිය හිමි කොටස් ලෙස සැලකිය යුතුය.

"විධායක අධ්‍යක්ෂවරයෙකු" යනු සේවා කොන්ත්‍රාතුවක් යටතේ සේවයේ නියුතු, මුදල් සමාගමේ වැටුප් ලේඛනයේ සිටින, එම මුදල් සමාගමේ පූර්ණ කාලීන වැටුප්ලාභී සේවකයෙකු වන අතර, දෛනික කළමනාකරණ වගකීම්වල නිරත වේ.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු මුදල් සමාගමේ සේවකයෙකු නොවන අතර, මුදල් සමාගමේ වැටුප් ලේඛනයේ නොසිටින අතර එමෙන්ම මුදල් සමාගමේ දෛනික කළමනාකරණ වගකීම් වල නිරත නොවෙයි.

විගණන නොවන සේවය යන්න 2012 දෙසැම්බර් මස නිකුත් කරන ලද බාහිර විගණකවරුන්ගේ මණ්ඩලය සඳහා වන මාර්ගෝපදේශය ලෙස හෝ එහි සංශෝධන යන අර්ථයෙන් යෙදෙයි.

බලපත්‍රලාභී මුදල් සමාගමේ "ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය" යන්නෙන්

i. ප්‍රධාන විධායක නිලධාරී

ii. අනුකූලතා නිලධාරී, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරී සහ සමාගම් ලේකම් ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම් සංවිධාන ව්‍යුහය මත ප්‍රධාන විධායක නිලධාරී මට්ටමට පහළ ආසන්නත ම ස්ථර දෙක තුළ සිටින නිලධාරීන් යන්න අර්ථවත් වේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන පරිදි, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් නිර්වචනය තුළ සඳහන් ආයතනයේ සහ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, යොමු කිරීම සහ පාලනය කිරීමේ අධිකාරය සහ වගකීම එවැනි නිලධාරීන් සතු විය යුතුය.

"සැහෙන සම්බන්ධතාව" යන්නෙන් මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය පරිදි එම අර්ථය ම අදහස් විය යුතුය.

**18. බලාත්මක වන දිනය**

මෙම විධානය පහත සඳහන් අන්තර්කාලීන විධිවිධානවලට යටත්ව, 2022.07.01 දින සිට බලාත්මක වේ.

**19. අන්තර්කාලීන විධිවිධාන**

**19.1** (අ) 3.2, 3.5 (අ) සහ 3.7 විධානයන්, 2024.07.01 දින සිට බලාත්මක වේ. අන්තර් කාලපරිච්ඡේදය තුළ දී, 2008 අංක 03 දරන මුදල් සමාගම්හි (ආයතනික යහපාලනය) විධානයේ "4 වන වගන්තියඃ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය" හි ඇතුළත් වූ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

(ආ) 3.4 විධානය වහාම බලාත්මක වනු ඇත.

**19.2** 8.1 විධානය (ආ)ඃ 2024.07.01 දක්වා අන්තර් කාලපරිච්ඡේදයක් ලබා දෙනු ඇත.

**19.3** 10.1 විධානයඃ 2024.07.01 තෙක් අන්තර් කාලපරිච්ඡේදයක් ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, අන්තර් කාල පරිච්ඡේදය තුළ දී, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානයෙහි "වගන්ති 8ඃ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු" යන විධානයෙහි ඇතුළත් ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**20. පූර්ව විධාන අහෝසි කිරීම**

19 වන විධානයෙහි විශේෂයෙන් ම දක්වා ඇති අන්තර්කාලීන විධිවිධානවලට යටත්ව, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානය, 2008 අංක 04 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය - සංශෝධනය) සහ මුදල් ව්‍යාපාර පනතේ 2013 අංක 06 දරන (ආයතනික යහපාලනය - සංශෝධනය) විධානය සහ මුදල් ව්‍යාපාර පනතේ 2020 අංක 05 දරන (ආයතනික යහපාලනය සඳහා සංශෝධනය) විධානය මෙම විධානය බලාත්මක දිනයේ සිට අවලංගු කෙරෙනු ඇත.

**නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති